**විල්ගමුව ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

විල්ගමුව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට විල්ගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6 ඡේදයේ 1.6.1 හි (අ), (ආ), (ඇ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ කර්මාන්ත ණයගැතියන්ගෙන් ලැබිය යුතු රු.3,899,991 ක් ණයගැති ගිණුමේ රු.3,799,991 ක් ලෙස සටහන් කිරීමේ වරද සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. | 2023 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ කර්මාන්ත ණයහිමියන්ට ගෙවූ රු.4,734,538 ක මුදල කර්මාන්ත ණයහිමි ගිණුමේ රු.3,500,338 ක් ලෙස සටහන් කිරීමේ වරද සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ඉකුත් වර්ෂයේ රු.1,059,200 ක කර්මාන්ත ණයහිමි ගෙවීමක් ප්‍රාග්ධන ගෙවීමක් ලෙස සටහන් කිරීමේ වරද සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමේදී කර්මාන්ත ණයහිමි ගිණුම හර කල යුතු වුවත් එම ගිණුම බැර කිරීම හා සමුච්චිත අරමුදලට හර කිරීම හේතුවෙන් කර්මාන්ත ණයහිමි ගිණුම රු.2,118,400 ක් වැඩියෙන් හා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන්ම අඩුවෙන් දැක්වුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.2,480,000 ක වාහන 04 ක් වෙන්දේසි කර තිබුණද මෝටර් රථ හා වාහන ගිණුමෙන් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුමෙන් රු.1,000,000 ක් ඉවත් කිරීම හේතුවෙන් එම ගිණුම් රු.1,480,000 කින් වැඩියෙන් දැක්වුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී ඉඩම් හා ගොඩනැගිලි ඒකක 16 ක් රු.62,035,000 කට තක්සේරු කර තිබුණද, එම තක්සේරු වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි. | 2023 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී පුස්තකාල ගොඩනැගිල්ලේ කුලී ආදායම සහ සතිපොල හා පොදු වැසිකිළිය බදුදීම මත ලැබිය යුතු ආදායම පිළිවෙලින් රු.150,000 ක් හා රු.250,000 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අතර රු.468,494 ක නොසැසදිමක් විය. | 2023 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ආ) | ගිණුම් විෂයයන් 11 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ අනුරූපි වාර්තා අනුව ශේෂයන් අතර රු.11,711,557 ක නොසැසඳීමක් විය. | ලේඛණ පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කල යුතුය. |

### 1.6.3 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දීර්ඝ කාලයක සිට පැවත එන වටිනාකම රු.1,501,545 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | අවිනිශ්චිත ගිණුමේ ශේෂය හදුනාගෙන නිරවුල් කළ යුතුයි. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.160,401,921 ක වටිනා ගිණුම් ශේෂ 10 ක ඔප්පු, උපලේඛන සහ ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරිම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරික්ෂා කල නොහැකි විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | උපලේඛන හා ශේෂ සනාථ කිරිම් ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **පාර්ලිමේන්තු පනත්** | | | |
| | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය | සභාවට අයත් මාර්ග ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි | විල්ගමුව ප්‍රාදේශීය සභාව බල ප්‍රදේශයේ මාර්ග මැනුම් කර මාර්ග ඉන්වෙන්ට්‍රිය සකසා යාවත්කාලීන කර ඇති බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | **රීති හා ප්‍රඥප්ති විධිවිධාන** | | | |
| | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | ඉඩම් හා ගොඩනැගිලි වලට අදාල වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ඉදිරියේ දී සමීක්ෂණ කටයුතු සිදු කිරීමට නියමිත බව | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | **අතුරු ව්‍යවස්ථා විධිවිධාන** | | | |
| | 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ගාස්තු 1 (ආ) කොටසේ පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වන කොටස | ප්‍රාදේශීය සභා සීමාවේ ප්‍රදර්ශනය කර ඇති ප්‍රචාරක දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | අදාළ සමීක්ෂණ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතින බව | සම්මත අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104(අ) | එකතු වටිනාකම රු.162,700 ක වීථි ලාම්පු කට්ටල වලට අදාළ විදුලි උපාංග අස්ථානගතවීම හා ආදාහනාගාර ආදායම ප්‍රාදේශීය සභා අරමුදලට බැර කර නොතිබීම සම්බන්ධයෙන් අදාළ පරික්ෂණයන් සිදුකර | මු.රෙ. 104(4) පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කමිටුවක් නම් කර කමිටුව අනුමත කර ගැනීම සඳහා මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් වෙත යොමු කර ඇති බව හා ඒ අනුව කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වගකිව යුතු පාර්ශවයන් හදුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඉ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නිලධාරින්ගේ පැමිණීම හා පිටවීම් සටහන් කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණි. | 2022.09.29 වන දින මෙම යන්ත්‍රය අක්‍රීය වී ඇති බව හා අළුත්වැඩියාව සඳහා අනුමැතිය නොලැබුනු බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,924,259 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,033,417 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i). වරිපනම් හා බදු | 680,000 | 709,688 | 1,151,420 | 788,227 | 680,000 | 709,688 | 89,566 | 1,229,959 |
| (ii). කුලී | 96,000 | 96,000 | 64,000 | 36,500 | 96,000 | - | - | 4,500 |
| (iii). බලපත්‍ර ගාස්තු | 800,000 | 741,845 | 1,557,760 | - | 800,000 | 815,915 | - | 815,915 |
| (iv). උසාවි දඩ | 5,000,000 | 2,934,814 | 3,230,228 | 10,041,398 | 5,500,000 | 2,488,988 | - | 10,336,812 |
| (v). මුද්දර ගාස්තු | 700,000 | 735,236 | 1,311,819 | 252,600 | 700,000 | 576,583 | - | 829,183 |
| (vi). වෙනත් ආදායම් | 4,911,000 | 4,900,160 | 5,485,281 | 5,102,961 | 4,000,000 | 4,606,524 | (8,127) | 5,688,082 |
| එකතුව | 12,187,000 | 10,117,743 | 12,800,508 | 16,221,686 | 11,776,000 | 9,197,698 | 81,439 | 18,904,451 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| | සභාව විසින් ඉකුත් වර්ෂයේ වරිපනම් බදු දේපළ තක්සේරු කර තිබියදි 2011 වර්ෂයේ වරිපනම් තක්සේරුව පදනම් කරගෙන බදු අය කර ගෙන තිබුණි. | තක්සේරුව 2021 වර්ෂයේ සිදුකර ඇති බව | නව තක්සේරුවට අනුව බදු අයකිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **වෙනත් ආදායම්** | | |
| i. | 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සතිපොලවල් 03 කට අදාළව රු.1,582,657 ක හිඟ කුලියක් අයකර නොතිබුණි. | මෙම හිග මුදල් කපා හැරීමට සභාව විසින් අනුමැතිය ලබා ගෙන ඇති බව | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| ii. | සභාව සතු පේරකනත්ත සතිපොලේ පෙර වර්ෂ වල හිග බදු මුදල් රු.250,000 ක් අයකරගෙන නොතිබුණු අතර ඉකුත් වර්ෂයේ අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ රු.1,300,000 ක් වැයකර සංවර්ධනය කර තිබූ මෙම සතිපොළ සමාලෝචිත වර්ෂයේ සිට වසා දමා තිබුණි. | 2023 වර්ෂයේ නැවත වරක් වෙළඳුන්, ජනතාව දැනුවත් කර සතිපොල ආරම්භ කර ඇති බව | ආදායම් උත්පාදනය කරන මාර්ග වලින් ආදායම් ලබාගැනීමට කටයුතු කල යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යතුරු පැදියක් පවරා ගැනිම වෙනුවෙන් ප්‍රමාද ගාස්තු රු.35,600 ක් ගෙවා තිබුණි. | ඉදිරියට මෙවැනි ප්‍රමාදයන් සිදු නොවන්නට කටයුතු කරන බව | මු.රෙ.156 විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් GI බට 40 ක ඌණතාවයක් සම්බන්ධයෙන් 2021 මාර්තු 17 දින සිදුකළ මු.රෙ. 104(4) පරීක්ෂණ වාර්තාවට අනුව අදාළ ඌණතාවය රු.119,937 ක් ඊට සම්බන්ධ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව නිර්දේශ දී තිබුණද අදාළ නිලධාරීන්ගෙන් අයකරගෙන නොතිබුණි. | කඩිනමින් මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව පරිහරණය කරන ඉඩම් 63 ක්, පොදු වෙළඳපල ඉඩම හා කැබ් රථයක අයිතිය සභාවට පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමට අදාළ කටයුතු කඩිනමින් සිදු කරන බව | වත්කම් පවරා ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.220,000 ක් ට්‍රැක්ටර් ටේලරයක් වසරක කාලයක් සිට නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | ට්‍රැක්ටර් ට්‍රේලරය 2022.12.31 දින භාණ්ඩ සමීක්ෂණය අනුව වෙන්දේසි කිරීමට කටයුතු කරන බවත්,එය සැදීමට විශාල මුදලක් දැරීමට සිදු වන නිසා මුදල් ප්‍රමාණවත් නොවීම නිසා මෙම තීරණය ගෙන ඇත. | විධිමත් පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේදී රු.1,000,000 ක ඇස්තමේන්තුගත මුදලකට ඉදිකළ කුඹුකන්දන මානගල පොදු ලිඳ අසලින් යන කොන්ක්‍රීට් මාර්ගයේ ඉදිකිරීම් තත්ත්ව පරීක්ෂණ වාර්තා අනුව අවස්ථා කිහිපයකදීම අසමත් වී ඇති නමුත් අදාල කාර්ය ගිවිසුම් ප්‍රකාරව ඉටු නොකල සමිතිය අසාදු ලේඛනගත කිරිමට හා අධික්ෂණ නිලධාරීන් සම්බන්ධ කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 නොවැම්බර් මස 08 වන දින ලබා ගත් මහසභා තීරණය යෝජනා අංක 12 අනුව මෙම සමිතිය අසාධු ලේඛණගත කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව | ගිවිසුම් ප්‍රකාරව කාර්යයන් සිදුකර නොමැති බැවින් අදාළ කොන්ත්‍රාත්කරු අසාදු ලේඛනගත කිරිමට හා අධීක්ෂණ නිලධාරින් සම්බන්ධව කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන සිට සභාවේ තනතුරු 09 ක පුරප්පාඩු පැවතුණි. | පළාත් පාලන කොමසාරිස් මධ්‍යම පළාත,ප්‍රධාන ලේකම් මධ්‍යම පළාත ලිඛිතව දැනුවත් කර ඇති බව | පුරප්පාඩු පිරවිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ස්ථාන මාරු වී ගොස් සිටින නිලධාරින් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.469,115 ක ණය ශේෂයක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කර දෙන ලෙස අදාළ ආයතන දැනුවත් කර ඇති බව | හිඟ ශේෂ අයකර ගැනිමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් විෂයන් 05 ක හා වියදම් විෂයන් 04ක තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී පිළිවෙලින් සියයට 05 සිට 49 දක්වා ද 15 සිට 100 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරීම සඳහා අවශ්‍ය උපදෙස් විෂය නිළධාරීන් හට උපදෙස් ලබා දෙන ලද බව | අවධානයෙන් අවශ්‍යතාවය සලකා බලා අයවැය පිළියෙල කළ යුතුය. |